11 වන පිටෙන්

දෙක එකල පටන්ම සිංහල සමාජය තුළ පැවතිණ. බින්න විවාහය සිදු වන්නේ බොහෝ විට, තරුණියගේ පවුලේ පිරිමි සාමාජිකයන් නැති විට පිරිමියකුගේ ශක්තිය, ආරක්ෂාව හා රැකවරණය එම පවුලට අවශ්‍ය වන බැවින් තම දියණියගේ ස්වාමිපුරුෂයා ද සමග ඇය තමන්ගේම නිවසේ, එහි වැඩිහිටියන් ද සමග ජීවත් වීමට යොමු වීම අවශ්‍ය වන විටය. මනාලයා, විවාහයෙන් පසුව මනාලියගේ නිවසේම නැවතී ජීවත් වීම බින්න විවාහය වන අතර මනාලයාගේ නිවසේ මනාලිය ජීවත් වීමට යොමු වීම දීග විවාහය ලෙස හැඳින්වුණි.

මේ අයුරින්, ළදැරිය, දැරිය, යෞවනිය යන අවස්ථා තුන පසු කරන කාන්තාවක් තරුණ වියේදීම, විවාහය සමග තම සැමියාගේ පතිනිය ලෙස ජීවත් වීම ඇරඹෙයි. පැරණි ඉන්දියානු සමාජයේ එවැනි තත්වයකට පත් වන ගැහැනියකට විශේෂ වූ විවිධ නීති රීති තිබුණ අතර සිංහල සමාජය තුළ ද ඒවාහේ ආභාසයෙන් පතිනියක සතු කාර්යභාරය තීරණය විය. සැමියාගේ පවුලේ වැඩිහිටියන් සමග ජීවත් වීම සැබවින්ම වර්තමාන සමාජයේ පතිනියකට භාරදූර කාර්යයක් වන්නට ඉඩ ඇත. සාම්ප්‍රදායික ගැටලුවක් වූ 'නැන්දම්මා . ලේලි' ගැටුම් ඇති වීම ද එවැනි පසුබිමක නොවැළැක්විය හැකි විය.

කෙසේ නමුදු නූතන සිංහල සමාජය තුළ දිගින් දිගටම සිදු වෙමින් පවතින වෙනස් වීම් සමග අද විවාහක යුවළ අතුරෙන් වැඩි දෙන මුල් පවුලෙන් වෙන්ව තමන්ගේම නිවහනක ජීවත් වීමේ ප්‍රවණතාව දැකගත හැකිය. එමගින් ඔවුන්ගේ නිදහස ආරක්ෂා වීමත් වැඩිහිටියන් සමග උද්ගත විය හැකි ගැටුම් අවම වීමත් අපේක්ෂා කළ හැකිය. පතිනිය කල් යාමේදී මවක් වෙමින් තවත් අලුත් අත්දැකීම්වලට මුහුණ දෙන විට අදත් සිංහල සමාජය තුළ වැඩිහිටියන්ගේ උදව් උපකාර අඩුවැඩි වශයෙන් ලබන්නට ඔවුනට හැකි වෙයි. මව් පදවියේ ඇති උත්තරීතර භාවය ප්‍රකට කර ලමින් අද ද සිංහල සමාජය තුළ තම දියණිය දරුවකු බිහි කළ විට එක්කෝ තම නිවසට කැඳවාගෙන විත් දියණියත් ඇයගේ දරුවාත් රැක බලාගැනීමට කැමැත්තෙන් පසුවන මව්වරු, නැතහොත් මිත්තණියෝ විරල නොවෙති.

පතිනිය දරුවන් බිහි කොට මව් පදවියේ සතුට විඳගන්නා අතර සමාජය ඇය දෙස හෙළන දෘෂ්ටිය ද එකලට වඩා අද වෙනස් වෙමින් පවතින බව කිව හැකිය. විශේෂයෙන්ම නාගරික පරිසරය තුළ අසල්වැසියන් එකිනෙකාගෙන් දුරස්ව ගෙවන ජීවිතවලදී එකල සමාජයේ පැවති සාමූහිකත්වය වෙනුවට පෞද්ගලිකත්වය පෙරට විත් යම් තරමක හුදෙකලා ජීවිත බවට ඔවුන්ගේ ජීවිත පත් වෙයි. මේ අයුරින් තමන් විසින් බිහි කරන ලද දූ පුතුන් හදා වඩා පෝෂණය කරගනිමින් ඔවුන්ට නිසි අධ්‍යාපනය ලබා දෙමින් සිය ජීවිත ගමන ඉදිරියට ගෙන යන පතිනිය, එමෙන්ම මව, කල් යාමේදී තම දරුවන් නිසි වයසට පිවිසි කල්හි ඔවුන්ගේ විවාහ සිදු කොට දෙමින් තම කාන්තා ජීවිතයේ අවසාන පියවරට, එනම් මිත්තණියගේ භූමිකාව ඉටු කිරීමට අවස්ථාව උදා කරගනියි. මෙලෙසින් ළදැරිය, දැරිය, යෞවනිය, තරුණිය, පතිනිය හා අවසානයේදී මිත්තණිය බවට පත් වන කාන්තාව එම අවසාන අදියරේදී එක්තරා දුරකට තෘප්තිමත් ජීවිත ගෙවන අවස්ථා දැකගත හැකිය.

ගැහැනිය යනු පිරිමියා හා සමව ගත යුතු විනා අවතක්සේරුවට ලක් කළ යුතු හෝ සූරාකෑමට ලක් කළ යුතු හෝ කෙනකු නොව සමාජයක් මෙන්ම පොදුවේ මානව වර්ගයා ඉදිරියට ගෙන යාම සඳහා තම ජීවන ගමනේ හැම පියවරක්ම කැප කරන අගනා පුද්ගලයකු ලෙස සැලකීම වඩාත් සාධාරණය. කාන්තාව පුරුෂයාට වඩා සියුමැලි බව ජීවවිද්‍යාත්මක සත්‍යයකි. එසේ වුවද ඇයගේ ශක්තිය, දරාගැනීමේ හැකියාව, ඉවසීමේ ගුණය යන මේවා පුරුෂ පක්ෂය විසින් හැම විටම ඇගයීමට ලක් කෙරෙන දිනය කවදා හෝ උදා වුවහොත් ළදැරිය, දැරිය, යෞවනිය, තරුණිය, පතිනිය සේම අවසන් අදියරේදී මිත්තණිය ද සතුටු සිතින් සිය දිවි ගමන ගෙවා නිම කරනු ඇත. මතුවට එවන් සමාජ පසුතලයකට අවශ්‍ය සියලු දේ ඉටු වේවා යන්න හැම කාන්තාවකගේම පැතුම වනු නොඅනුමානය.

## දැන්ම ගොඩවෙන්න




සන්නස ඔක්තෝබර් මාසයේ පළවූ 'දැම්ම ගොඩවෙන්න' නාට්‍යයේ ලිපියේ නිවැරදි විය යුතු කොටසක් ගැන පාඨක ඔබගෙන් මම පළමුව සමාව ඉල්ලා සිටිමි. එම ලිපිය ලිවීමට පෙර මා සමග කරණ ලද සාකච්ඡාවේදී මා පැවසූ දෙයක් වැරදි ලෙස වටහාගෙන අර්ථකතනය වී තිබේ. එහිදී සාකච්ඡාව කරන ලද මගේ හිතවතා මගෙන් අසා සිටි එක ප්‍රශ්නයක් වූයේ ''මෙය තවත් ජාතක කතාවක් යන්නයි. එහිදී මා ඔහුට දීර්ඝ පිළිතුරක් දුන් අතර ඔහු එහි සංස්කරණය කිරීමේදී මෙම අඩු පාඩුව වී තිබේ. එහිදී මා පවසා සිටියේ බෞද්ධ සාහිත්‍යය බුදු දහමේ හරය අවබෝධ කරගන්න අත්‍යවශ්‍ය සාධකයක් නොවන බවත් ත්‍රිපිටකය, අභිධර්ම, සූත්‍ර කට පාඩම් කිරීමෙන් පමණක් බුදු දහමේ හරය අවබෝධ කරගත නොහැකි බවත්ය. නමුත් ලිපියේ එය පළවූයේ ත්‍රිපිටක, අභිධර්ම සූත්‍ර බුදු දහමේ හරය අවබෝධ කරගන්න අත්‍යාවශ්‍ය සාධක නොවන බවයි. එහිදී උක්ත අතපසු වීම නිසා කිසියම් හෝ අයෙකු අපහසුතාවයකට පත් වූවා නම් මා ඉතාමත් කාරුණිකව සමාව ඉල්ලා සිටිමි.

මාගේ මෙම නාට්‍යයේ උත්සාහ ගන්නේ අනෙකුත් සෑම දෘෂ්ටිවාදී සංකල්පයක්ම පසක ලා බුදු දහමේ පිළිබිඹු වන ජීවිතයේ යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමටයි. එහිදී මේ තාක් නිර්මල බුදු දහම ආරක්ෂා කර දුන් ත්‍රිපිටකය වැනි පුස්තකයන්ගේ අත්‍යාවශ්‍යතාවය මා කිසිසේත් අවතක්සේරු කරන්නේ නැත. මා දැඩිව විශ්වාස කරන්නේ අදටත් නියම නිර්මල බුදු දහම ලියා ඇත්තේ ත්‍රිපිටකයේ බවයි.

**ගයාන් කණිෂ්ක රාජපක්ෂ.**

## සංක්‍රමණික මිතුරුතුමෝ

ශ්‍රී ලංකාවේ සිට ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වන මිතුරන් වෙනුවෙන් යමක් කිරීමට උත්සාහ කරන මෙහි කාලයක් ජීවත් වූ ශ්‍රී ලාංකිකයන් මට නිතර හමුවේ. මෙල්බර්න් ගුවන් තොටුපොළේදී ඔවුන්ව පිළිගෙන තම නිවසට රැගෙන ගොස් ඔවුන් වෙනුවෙන් වෙන් කළ කාමරය ලබාදී උපරිම අන්දමින් සිය මිතුරන් බලා කියා ගන්නා ඕස්ට්‍රේලියානු වාසී ලාංකිකයන් ඉඳුම් හිටුම් පමණක් නොව රැකියාවක් පවා සොයා දී තම මිතුරා සහ ඔහුගේ පවුල වෙනුවෙන් උපරිම අනුග්‍රහය ලබාදෙනු මම කොතෙකුත් දැක ඇත්තෙමි.

නිර්වර්ණ
උපේක්ෂා සේනානායක
COLOURLESS

මෑතකදී මගේ මිතුරෙක් එසේ ලංකාවේ සිට සංක්‍රමණය වූ ඔහු දන්නා හඳුනන පවුලකට සිය නිවසේ නවාතැන් පහසුකම් ලබා දී මාසයකට ආසන්න කාලයක් රැකවරණය ලබාදුන්නේය. ඔවුන්ට ඔස්ට්‍රේලියානු බදු අංකය (TFN) ලබාගැනීම, සෞඛ්‍ය සේවා කාඩ්පත ඇතුළු රජයෙන් ලැබෙන සියළුම සහන සේවා ලබාගැනීමට අවශ්‍ය තොරතුරු ලබාදීම පමණක් නොව තම නිවසේ නිතර භාවිතයට නොගත් මෝටර් රථය පවා පාවිච්චි කිරීමට අවස්ථාව ලබාදුන් මගේ මිතුරා , සංක්‍රමණය වූ සිය මිතුරු පවුල වෙනුවෙන් ලාංකිකයෙකු ලෙස අවංක සේවයක් කළේය. නමුත් මෑතකදී මෙරටට සංක්‍රමණය වූ ඒ පවුල මගේ මිතුරාගේ නිවසෙන් පිටව ගිය අවම වශයෙන් තමන් පදිංචියට යන තැනවත් ඔහුට නොදන්වාය.



මෙය නිතර අසන්නට ලැබෙන සාමාන්‍ය තත්ත්වයකි. මෙරටට සංක්‍රමණය වන බොහෝ උදවිය තමන්ට උදව් උපකාර කළ මෙරට ජීවත් වූ ලාංකිකයන්ට කළ ගුණ නොදක්වා පිටව යෑම අතිශය අකා රුණික සහ අකෘතඥ ස්වභාවයකි.
මා ඒ පිළිබඳව එකතු කළ කරුණු අතරින් මා විසින්ම අධ්‍යයනයක යෙදීමේදී මට ඒත්තු ගිය කාරණා කීපයකි.

අලුතින් සංක්‍රමණය වන උදවිය සිතනුයේ මෙරට මුල්බැස ගත් සිය මිතුරන් හෝ ඥාතීන් තමන් වෙනුවෙන් ඕනෑම උපකාරයක් කිරීමට බැඳී සිටින බවය. මීලඟ කරුණ වන්නේ ඔවුහු මෙරටට පැමිණි පසු කිසිවෙක් අලුතෙන් හඳුනා ගතහොත් තමන්ට මෙතෙක් උපකාර කළ මිතුරා පහසුවෙන් අමතක කිරීටම පෙළඹෙති. ඉන් පසු මෙතෙක් උපකාර කළ මිතුරා ලඝු කොට තැකීමටත් ඔහු නොතකා හැරීමටත් අළුත් මිතුරන්ගේ වර්ණනාවත් අරඹති. මෙය අමනාපයක් දක්වා වර්ධනය වී ඔවුන් අතරමගදී හමුවුණත් මුහුණ නොබලන තත්ත්වයක් දක්වා ඔඩු දුවනු නිරීක්ෂණය කළ හැක. එය කණගාටුදායක අවසානයකි.

මගේ කනට වැටුණු බොහෝ සිදුවීම් නිවීහැනහිල්ලේ විශ්ලේෂණය කළ විට මට හිතෙන්නේ මෙය ජීවන රටා දෙකක ගට්ටනයක් ලෙසිනි. ලංකාවේ සිටින බොහෝ තරුණ මව්වරු ගෙදර දොර වැඩ තම මව හෝ මෙහෙකරුවන් වෙතින් ඉටුකර ගැනීමට පුරුදු වී සිටිති. නමුත් මෙරටට සංක්‍රමණය වූ අපි රැකියාවත් ගෙදරදොර වැඩත් දරුවන්ගේ වැඩත් තනිවම සහ කාර්යක්ෂමව කරගැනීමට තරම් නිපුණත්වයකට ලඟා වී සිටිමු. මේ තත්තවය මත අතිශය කාර්යයබහුල ජීවිතයක් ගෙවන අපට තවත් අතිරේක පවුලක් වෙනුවෙන් කාලය සපයාගෙන යමක් ඔවුන් වෙනුවෙන් ඉටු කිරීමම එක්තරා අභියෝගයකි. එවන් පසුබිමක් මත සංක්‍රමණික පවුලෙන් පෙරළා සහයෝගයක් නොලැබෙන විට වැඩිපුරම පීඩනයට පත්වන්නේ ගෙදර ගෘහණියයි. අවම වශයෙන් මුළුතැන්ගෙය පිරිසිදු කිරීමටවත් සහායක් නිවසේ නතර වී සිටින උදවියගෙන් නොලැබෙන විට එය අවසන් වන්නේ කලකිරීමකිනි. මගේ එක්තරා මිතුරියක් කීවේ ඔවුන් සමඟ තෙමසක් පමණ නතර වී සිටි යුවළක් පිටව ගියේ අවම වශයෙන් ඔවුන් පරිහරණය කළ සයනය වත් පිළිවෙලකට අස්පස් නොකර කුණු ගොඩක් කාමරය තුළ එකතු කර තබා බවය. අවසානයේ කිසිවෙක් වෙනුවෙන් උදව් උපකාර නොකිරීමට තමන් දැඩි තීරණයක් ගත් බව ඇය කියා සිටියාය.

කාර්යය බහුල ජීවිතයක් ගෙවන ඔස්ට්‍රේලියානු වාසී ලාංකිකයන් මෙරටට සංක්‍රමණය වන මිතුරන් වෙනුවෙන් එක් දිනයක් වෙන් කළත් එයම විශාල උපකාරයක් බව දැනෙන්නේ වසර කීපයක් ගිය තැන ඔවුන්ද මෙරටට අනුගත වී තම ජීවිත රටාව වෙනස් කරගත් විටදීය. එතෙක් එය ඔවුනට මහ ලොකු දෙයක් නොවන්නේය.